# පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 03 යි

## 11 ශ්‍රේණිය – 2019 – පළමුවාර පරීක්ෂණය

### I කොටස

**සැලකිය යුතුයි :-**

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය.**
- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් ගැළපෙන පිළිතුර** තෝරා යටින් ඉරක් අඳින්න .

1. නියෝජන ප්‍රජාන්ත්‍රවාදය යනුවෙන් හඳුන්වන්නේ,
   (1) ඍජු ප්‍රජාතන්ත්‍රවාදයයි. (2) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි.
   (3) රාජාණ්ඩු ක්‍රමය යි. (4) රදළ ආණ්ඩුක්‍රමයයි.

2. ඒක පක්ෂ ක්‍රමයක් ඇති රටකට උදාහරණයකි,
   (1) මහා බ්‍රිතාන්‍යය (2) ඇමරිකා එක්ස් ජනපදය (3) ප්‍රංශය (4) ශ්‍රී ලංකාව

3. ඍජු ප්‍රජාන්ත්‍රවාදී පාලනයක දී ඇති වන ගැටලුවක් වන්නේ,
   (1) පුරවැසියන්ගේ ආදායම් විෂමතාව යි (2) ජනගහණය අධික වීමයි
   (3) විවිධ පක්ෂ ඇති වීමයි (4) නියමිත කාලයේ දී මැතිවරණ නොපැවැත්වීම යි

4. ප්‍රජාන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාව සතු බලය වන්නේ,
   (1) සර්ව ජන ඡන්ද බලය යි (2) පරමාධිපත්‍ය බලය යි
   (3) නීත්‍යානුකූල බලය යි (4) ජනමත විචාරණ බලය යි

5. මහාධිකරණය සතු බලතලයකි,
   (1) පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීම.
   (2) වාණිජ ආරවුල් විසඳීම.
   (3) ජනමත විචාරණ පෙත්සම් විභාග කිරීම.
   (4) බරපතල අපරාධ සම්බන්ධ නඩු විසඳීම.

6. ශ්‍රී ලංකාවේ දිසා අධිකරණ පිහිටුවා ඇති අධිකරණ දිස්ත්‍රික්ක ගණන වන්නේ,
   (1) 54 කි. (2) 34 කි. (3) 64 කි. (4) 44 කි.

7. පහත ‘අ’ තීරුවේ සඳහන් අධිකරණ ආයතන සමග ‘ආ’ තීරුවේ ඇති කටයුතු නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

| ‘අ’ | ‘ආ’ |
|---|---|
| 1. මහේස්ත්‍රාත් අධිකරණය | A. බරලතල අපරාධ නඩු |
| 2. මහාධිකරණය | B. විවාහ සම්බන්ධ නඩු |
| 3. ශ්‍රේෂ්ඨාධිකරණය | C. පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීම |
| 4. අභියාචනාධිකරණය | D. යුද්ධ, ගුවන්, නාවුක හමුදා සම්බන්ධ නඩු |
| | E. ජනමත විචාරණ පෙත්සම් විභාග කිරීම |

   (1) A,B,D,E (2) D,C,E,A (3) A,C,D,E (4) B,A,D,C

8. ආරවුල් බේරුම්කරණය සඳහා අනුගමනය කරන ක්‍රමාවේද දෙකක් වන්නේ,
   (1) මානසික දණ්ඩනය හා කායික දණ්ඩනයයි. (2) උපදේශනය හා සමථකරණයයි.
   (3) සාකච්ඡාව හා දණ්ඩනය යි. (4) උපදේශනය හා කායික දණ්ඩනය යි.

9. සාකච්ඡා ක්‍රමය මගින් දෙපාර්ශවයටම ලැබෙන විසඳුම කුමක්ද?
   (1) ජය-පරාජය විසඳුම. (2) ක්ෂණික විසඳුම හා ජය.
   (3) ජය-සාකච්ඡා විසඳුම. (4) ජය-ජය විසඳුම.

10. මැදිහත්කරුවකු තුළ පැවතිය යුතු ගුණාංග වන්නේ,
   (1) පක්ෂපාතීත්වය හා කැපවීම (2) හොඳ සවන් දෙන්නෙකු වීම හා මධ්‍යස්ථභාවය
   (3) විශ්වාසවන්තභාවය හා අවංක නොවීම (4) කැපවීම හා වංක භාවය

11. ශ්‍රී ලංකික පුරවැසියෙකුට ඡන්දය පාවිච්චි කිරීමට අවම වයස් සීමාව වන්නේ,
   (1) වයස අවුරුදු 18 සම්පූර්ණ වීමය (2) වයස අවුරුදු 16 සම්පූර්ණ වීමය
   (3) වයස අවුරුදු 21 සම්පූර්ණ වීමය (4) වයස අවුරුදු 20 සම්පූර්ණ වීමය

12. ’ප්‍රජාතන්ත්‍රවාදය යනු සියළු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමය යි’ මෙම ප්‍රකාශය කරනු ලැබූ චින්තකයා වන්නේ,

(1) ඒබ්‍රහම් ලින්කන් ය (2) වින්සන්ට් චර්චිල් ය (3) සීලර් ය (4) අයිවර් ජෙනින්ග්ස් ය

13. නියෝජන හෙවත් වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යටතේ පුරවැසියන්ට සෘජුවම පාලනයට සම්බන්ධ වීමට ඇති ඉඩකඩ,
 (1) සීමාසහිත වේ. (2) අසීමිත වේ. (3) සීමාරහිත වේ. (4) අසීමිත නොවේ.

14. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ප්‍රධාන කොටස් 3 අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
 (1) විධායකය, අධිකරණය, ව්‍යවස්ථාදායකය (2) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය
 (3) විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය (4) අධිකරණය, විධායකය, ව්‍යවස්ථාදායකය

15. නීතියට අනුව පාලනය කිරීම හඳුන්වන්නේ,
 (1) නීතියේ සාධාරණත්වය යනුවෙනි. (2) නීතියේ බලතල යනුවෙනි.
 (3) නීතියේ ක්‍රියාත්මකභාවය යනුවෙනි. (4) නීතියේ ආධිපත්‍යය යනුවෙනි.

16. ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස සලකනු බලන රට වන්නේ,
 (1) ස්විස්ටර්ලන්තය (2) ග්‍රීසිය යි (3) ඉන්දියාව යි (4) එංගලන්තය යි

17. කැන්ටන් නමින් හඳුන්වන ප්‍රාන්ත රාජ්‍ය 26 කින් යුතු සන්ධීය රාජ්‍යය වන්නේ,
 (1) ඉතාලිය යි (2) ඇමරිකා එක්සත් ජනපදය යි (3) ස්විස්ටර්ලන්තය යි (4) මහා බ්‍රිතාන්‍යය යි

18. විවිධ ජන වර්ග, ආගම් හා භාෂා වලින් යුතු කණ්ඩායම් එකට එකමුතුව ජීවත් වන සමාජයක් හඳුන්වන නාමය වන්නේ,
 (1) බහු ආගමික සමාජය යනුවෙනි (2) බහු සංස්කෘතික සමාජය යනුවෙනි
 (3) බහු ජන වාර්ගික සමාජය යනුවෙනි (4) බහු පාක්ෂික සමාජය යනුවෙනි

19. යම් තැනැත්තෙකුට පැවරෙන වගකීම ඉටු කිරීම සම්බන්ධ වූ බැඳීම හඳුන්වන නාමය වන්නේ.
 (1) වගකීම යි (2) ඉටු කිරීම යි (3) වගවීම යි (4) බැඳීම යි

20. පරිපාලන කටයුතු පිළිබඳ මහ කොමසාරිස්වරයා හඳුන්වන වෙනත් නාමයකි,
 (1) ඔම්බුඩ්ස්මන් (2) සභානායක (3) කථානායක (4) නීති නිලධාරි

21. පහත 'අ' තීරුවේ ගැටුම් වර්ග ද 'ආ' තීරුවේ එම ගැටුම් වලට නිදසුන් ද ඇත. නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. දේශපාලන ගැටුම් | A. කුරුස යුද්ධය |
| 2. ආගමික ගැටුම් | B. ඊශ්‍රායලය හා පලස්තීන ගැටුම් |
| 3. දේශසීමා ගැටුම් | C. හින්දු හා හරිජනයා අතර ගැටුම් |
| 4. ගෝත්‍රකුල ගැටුම් | D. ඉන්දුනීසියාව හා නැගෙනහිර ටිමෝරය අතර ගැටුම් |
| | E. ඉරාකය හා ඇමරිකා එක්සත් ජනපදය අතර ගැටුම් |

 (1) E,B,A,C (2) D,A,B,C (3) D,A,E,C (4) C,A,B,E

22. නීතියේ මූලික අරමුණ වන්නේ,
 (1) සියලු වැරදිකරුවන්ට දඬුවම් ලබා දීම යි (2) සියලු පුරවැසියන්ට සාමය ඇති කර දීම යි
 (3) සියලුම පුරවැසියන්ට යුක්තිය ඉටු කිරීම යි (4) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම යි

23. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු විසින් ඉටු කළ යුතු නීතිමය යුතුකමක් වන්නේ,
 (1) පොදු ආයතන ආරක්ෂා කිරීම ය (2) පෞද්ගලික ආයතන ආරක්ෂා කිරීම ය
 (3) පොදු දේපල ආරක්ෂා කිරීම ය (4) පෞද්ගලික දේපල ආරක්ෂා කිරීම ය

24. මහාධිකරණය මගින් විභාග කරනු ලබන නඩු පමණක් අඩංගු වරණය වන්නේ,
 (1) දික්කසාද නඩු, ස්ත්‍රී දූෂණ, මිනිමැරුම් (2) ස්ත්‍රී දූෂණ, බුදල් නඩු, මිනිමැරුම්
 (3) මිනිමැරුම්, රාජ්‍ය විරෝධී, කුමන්ත්‍රණ දික්කසාද නඩු (4) ස්ත්‍රී දූෂණ, මිනිමැරුම්, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ

25. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,
 (1) නීතිපතිතුමා ය (2) අගවිනිසුරුතුමා ය (3) ඔම්බුඩ්ස්මන් වරයා (4) පොලිස්පතිතුමා ය

26. ඒක පක්ෂ ක්‍රමයක් ඇති රටකට නිදසුනකි,
 (1) ඕස්ට්‍රේලියාව (2) චීනය (3) ඇමරිකා එක්සත් ජනපදය (4) ඉන්දියාව

27. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත්කරනු ලබන්නේ,
 (1) අගමැතිවරයා විසිනි (2) කථානායකවරයා විසිනි
 (3) ජනාධිපතිවරයා විසිනි (4) ප්‍රධාන අමාත්‍යවරයා විසිනි

28. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකු සතු විය යුතු ගුණාංගයක් වන්නේ,
 (1) අන්‍ය ආගම් වලට ගරු කිරීම ය (2) අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම ය
 (3) අන්‍ය මත වලට ගරු කිරීම ය (4) අන්‍ය විශ්වාස හා ඇදිහිලි වලට ගරු කිරීම ය

29. මිනිස් උවමනා ඉටු කර ගැනීමේදී නිෂ්පාදිත සාධක ප්‍රධාන කොටස් දෙකකි. ඒවා නම්,
(1) ආර්ථික භාණ්ඩ හා පාරිභෝජන භාණ්ඩ (2) ආර්ථික භාණ්ඩ හා සේවා
(3) ආර්ථික නොවන භාණ්ඩ හා නිෂ්පාදිත භාණ්ඩ (4) ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ

30. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයකි,
(1) ජනමත නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම
(2) අත්තනෝමතික පාලනයක් බිහිවීම
(3) ඡන්ද දායකයන් තෝරා ගැනීමේ අවස්ථා අහිමි වීම
(4) ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය කිරීම තුළින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථා හිමිවීම

31. ගැටුම් නිරාකරණය කිරීම සඳහා යොදා ගනු ලබන සාම්ප්‍රදායික ක්‍රමයක් වන්නේ,
(1) උපදේශනය යි. (2) නඩු මගට යොමු කිරීම යි. (3) විනිසීම යි. (4) සමථ මණ්ඩලයට යොමු කිරීම යි.

32. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණ පුද්ගලයා වන්නේ,
(1) ආණ්ඩුකාරවරයා ය (2) මහ ඇමතිවරයා ය (3) ජනාධිපතිවරයා ය (4) අගමැතිවරයා ය

33. ධනවාදී සහ සමාජවාදී අර්ථ ක්‍රම දෙකෙහි ම ලක්ෂණ ඇතුළත් අර්ථ ක්‍රමය වන්නේ,
(1) ධනවාදී අර්ථ ක්‍රමය යි. (2) සමාජවාදී අර්ථ ක්‍රමය යි. (3) මූලික අර්ථ ක්‍රමය යි. (4) මිශ්‍ර අර්ථ ක්‍රමය යි.

34. සප්ත අපරිහානි ධර්මයන් පැවති රට කුමක්ද?
(1) ශ්‍රී ලංකාව (2) බුරුමය (3) ඉන්දියාව (4) චීනය

35. ග්‍රීසියේ ඇතැන්ස් රාජ්‍ය වල පාලනයට සහභාගී වීමට නොහැකි වූ පුද්ගලයන් වන්නේ,
(1) වහලුන් හා වැඩිහිටි පුද්ගලයන්ට ය (2) නගරවැසි කාන්තාවන්ට හා තරුණයන්ට ය
(3) ආගමික පූජකවරුන්ට හා වහලුන්ට ය (4) නගරවැසි කාන්තාවන්ට හා විදේශිකයන්ට ය

36. ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම අභියාචනාධිකරණය ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) අභියාචනාධිකරණය යි (2) ශ්‍රේෂ්ඨාධිකරණය යි (3) යුද්ධාධිකරණය යි (4) මහාධිකරණය යි

37. වෘත්තීය ක්ෂේත්‍රය තුළ සේව්‍ය සේවක දෙපක්ෂය අතර ගැටුම් ඇති වූ විට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ආරවුල් විසදා ගැනීමට බහුලව භාවිතා කරන ක්‍රමය වන්නේ,
(1) සාකච්ඡා ක්‍රමය (2) සමකරණය (3) බේරුම්කරණය (4) මැදිහත්කරණය

38. ශ්‍රී ලංකිකයන්ට එකම ඡන්ද කොට්ඨාසයක් ලෙස ඡන්දය භාවිතා කිරීමට ලැබෙන අවස්ථාවක් වන්නේ,
(1) පළාත් පාලන මැතිවරණය යි (2) පළාත් සභා මැතිවරණය යි
(3) ජනාධිපතිවරණය යි (4) මහා මැතිවරණය යි

39. ප්‍රජාතන්ත්‍රවාදී රටක විරුද්ධ පක්ෂයකින් ඉටුවිය යුතු කාර්යයක් වන්නේ,
(1) ජනමාධ්‍ය මගින් රජය පිළිබඳව අප්‍රසාදයක් ජනතාව තුළ ඇති කිරීම ය.
(2) රජයට සම්බන්ධ මැති ඇමතිවරුන් විරුද්ධ පක්ෂයට එක්කර ගැනීමට කටයුතු කිරීම ය.
(3) රජය විසින් ගෙන එනු ලබන පනත් වලට විරෝධතා ඇති කිරීමය.
(4) යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට කටයුතු කිරීම ය.

40. නීතියේ ආධිපත්‍ය තහවුරු වී තිබෙන සමාජයක දැකිය හැති ලක්ෂණයක් නොවන්නේ,
(1) ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම ය.
(2) පුද්ලයන්ගේ තරාතිරම, රැකියාව, ධනය හෝ වෙනත් කරුණු පදනම් කරගෙන නීතිය ක්‍රියාත්මක කිරීම ය.
(3) නීතිය පිලිබඳ ව සෑම පුරවැසියෙකුට ම අවබෝධයක් තිබීම ය
(4) සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසඳලීම.

**පුරවැසි අධ්‍යාපනය**

**11 ශ්‍රේණිය – 2019 – I වාරය**

**II කොටස**

**පළමුවන ප්‍රශ්ණය සහ තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) නීතිය අර්කථනය කරනු ලැබූ චින්තකයන් දෙදෙනෙකුගේ නම් ලියන්න.
    (2) නීතියේ මූලාශ්‍ර 2 ක් ලියන්න.
    (3) අපරාධ නීතියට අනුව බලපාන වැරදි 2 ක් ලියන්න.
    (4) ලන්දේසි යුගයේ දී ක්‍රියාත්මක වුනු ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්ක 2 ක් සඳහන් කරන්න.
    (5) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව හා අධිකරණ සංවිධාන පනතට අනුව ශ්‍රී ලංකාවේ දැක්වෙන අධිකරණ පද්ධතියට අයත් අධිකරණ 2 ක් ලියන්න.
    (6) යුරෝපයේ බිහිවූ ප්‍රථම ජාතික රාජ්‍ය 2 ක් ලියන්න.
    (7) මූලික අර්ථක්‍රම දෙකක් නම් කරන්න.
    (8) ඉතා සංකීර්ණ බහු සංස්කෘතියක් පවතින රටවල් දෙකකට උදාහරණ සපයන්න.
    (9) ස්විස්ටර්ලන්තයේ නිල භාෂා 4 ක් ඇත. ඉන් දෙකක් නම් කරන්න.
    (10) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 2 ක් ලියන්න. (2x10=20)

02. (1) අන්තර් ජාතික නීතිය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල:2)
    (2) අන්තර් ජාතික නීතිය ඇසුරෙන් පැන නැගුණ නීති ශාඛා වලට නිදසුන් 3 ක් ලියන්න. (ල:3)
    (3) "ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය රෝම ලන්දේසි නීතියයි." මීට අමතරව ඇති වෙනත් විශේෂ නීති වර්ග 3 ක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:5)

03. ගැටුම් ඇති වීමට පුද්ගල මනස මුල්වේ. මානසික සාමය ඇති කිරීම මගින් ගැටුම්කාරී ස්වභාවය අවම කිරීම හෝ ඉවත් කිරීම කළ හැකිය.
    (1) මනසේ සාමය ඇති කිරීම සඳහා යොමුවිය හැකි අංශ 2 ක් සඳහන් කරන්න. (ල:2)
    (2) ගැටුම් ඇතිවන පාර්ශව 3 ක් ලියන්න. (ල:3)
    (3) ගැටුම් පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ජොහැන්ස් ගැල්ට්‍රන් විසින් ඉදිරිපත් කරන ලද ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඇඳ නම් කරන්න. මින් එක් අරගලයක් කෙටියෙන් විස්තර් කරන්න. (ල:5)

04. (1) යුක්තිය ඇති කිරීම පිළිබඳ ප්‍රධාන කරුණු 2 ක් සඳහන් කරන්න. (ල:2)
    (2) සියළු දෙනාම නීතිය ඉදිරියේ සමාන විය යුතු අතර නීතියේ රැකවරණය සඳහා අයිතිවාසිකම් ලබති. නීතියේ ගුණාංග 3 ක් ලියන්න. (ල:3)
    (3) දේශීය නීතිය හඳුනාගතහැකි කොටස් 3 ක් ලියා ඉන් එක් නීතියක් කෙටියෙන් විස්තර කරන්න. (ල:5)

05. (1) නවීන තාක්ෂණයත් සමගම නිර්මාණය වී ඇති නිෂ්පාදන 2 ක් ලියන්න. (ල:2)
    (2) ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 3 ක් ලියන්න. (ල:3)
    (3) ගෝලීයකරණය ව්‍යාප්ත වීමට බලපානු ලැබූ හේතු 3 ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල:5)

06. (1) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක විධායකය සකස් වී ඇති අංශ 2 කි. එය සඳහන් කරන්න. (ල:2)
    (2) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණ 3 ක් සඳහන් කරන්න. (ල:3)
    (3) ජනාධිපති ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ 3 ක් සඳහන් කර ඉන් එක් ලක්ෂණයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:5)

07. (1) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක 2ක් ලියන්න. (ල:2)
    (2) ශ්‍රී ලංකාවට වෙළදාම සඳහා පැමිණි විවිධ ජාතීන් 3 ක් සඳහන් කරන්න. (ල:3)
    (3) බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියා ඉන් එකක් පිළිබඳව ඔබේ අදහස් ලියා දක්වන්න. (ල:5)